සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2009

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2009 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

**විභාග අංකය** ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ** සපයන්න.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතරෙන්, එක් එක් ප්‍රශ්නය **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| පළමුවන පරීක්ෂක | | |
| දෙවන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

[2 වැනි පිටුව බලන්න

- **එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර, දී ඇති පිළිතුරු තුන අතරෙන් තෝරා, යටින් ඉරක් අඳ**

- මුල් රූපයට සමාන රූපය තෝරන්න.

**1.** 


(1)


(2)


(3)

**2.** 


(1)


(2)


(3)

- එක් එක් කවියේ හිස්තැනට **වඩාත් ම** ගැළපෙන වචනය තෝරන්න.


**3.** මලක් පිපෙයි
සුවඳ හමයි
මල පරවෙයි
පෙති ............

(1) සෙලවෙයි (2) ගිලිහෙයි (3) ලෙළදෙයි


**4.** දරු පිරිසක්
සිටින තැනක්
මල් දහසක්
පිපුණු .........


(1) ඇලක් (2) දෙලක් (3) විලක්



- මුලින් දී ඇති රූප දෙක එක මත එක තැබූ විට ලැබෙන රූපය තෝරන්න.


**5.**  


(1) 


(2) 

(3) 

**6.**  

(1) 

(2) 

(3) 

[3 වැනි පිටුව

• පහත දැක්වෙන වාක්‍ය වඩාත් අර්ථවත් වන සේ කළ යුතු වෙනස්කම තෝරන්න.


7. සමනලයා රෝස මලේ දිය බොයි.

(1) සමනලයා වෙනුවට **බමරා** යෙදීම
(2) රෝස වෙනුවට **නෙළුම්** යෙදීම
(3) දිය වෙනුවට **පැණි** යෙදීම

8. ළමයා පාරේ පාඩම් කරයි.


(1) ළමයා වෙනුවට **පුතා** යෙදීම
(2) පාරේ වෙනුවට **කාමරයේ** යෙදීම
(3) පාඩම් වෙනුවට **ආරම්භ** යෙදීම


• කොටු තුළ බෝල යොදා ඇති ආකාරය අනුව හිස් කොටුවට ගැළපෙන පිළිතුර තෝරන්න.

9. 


(1)



(2)


(3)


10. 


(1)


(2)


(3)

• වර්ගඵලය වර්ග සෙන්ටිමීටර 1 බැගින් වන සමචතුරස්‍ර 16 කින් පහත දැක්වෙන රූපය සමන්විත වේ.



11. එහි පාට කර ඇති කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීය ද?


(1) 8 (2) 10 (3) 12

12. එහි පාට කර ඇති කොටසේ වර්ගඵලය මුළු වර්ගඵලයෙන් කුමන භාගයක් ද?


(1) $\frac{1}{4}$ (2) $\frac{1}{2}$ (3) $\frac{3}{4}$

[4 වැනි පිටුව බලන්

● රූපයේ දැක්වෙන හැඩය ඇති කඩදසියක් පළමුවෙන් කඩ ඉර දිගේ දෙකට නවා, ඉන්පසු පැති දෙක[...] අසුවනසේ තිත් ඉරි දිගේ කැපූ විට ලැබෙන ත්‍රිකෝණ ගණනත් චතුරස්‍ර ගණනත් පිළිවෙළින් කිය ද[...]


**13.** 


(1) 4 සහ 2
(2) 3 සහ 1
(3) 2 සහ 2

**14.** 



(1) 3 සහ 1
(2) 3 සහ 2
(3) 4 සහ 2

● රටාව අනුව ඊළඟට ගැළපෙන රූපය 1, 2 හා 3 අතරෙන් කුමක් ද?

**15.**  .........



(1) (2) (3)

**16.**  .........




(1) (2) (3)

**17.** හිස්තැනට ගැළපෙන රූපය කුමක් ද?





 .........



(1) (2) (3)

[5 වැනි පිටුව බලන්න

• △ + △ = 24 බවත් □ − 5 = △ බවත් □ + △ = ⬠ බවත් දී ඇත.


**18.** □ සඳහා ගැළපෙන අගය කීය ද?

(1) 12 (2) 17 (3) 29

**19.** △ + □ + ⬠ සඳහා ගැළපෙන අගය කීය ද?

(1) 17 (2) 29 (3) 58

**20.** ඉලක්කම් සහිත රෝදය සරල රේඛාව දිගේ ඉදිරියට පෙරළූ විට හමුවන ? ලකුණ යොදා ඇති කොටුවලට ගැළපෙන සංඛ්‍යා පිළිවෙළින්




(1) 2 හා 9 වේ.
(2) 3 හා 2 වේ.
(3) 3 හා 9 වේ.

**21.** ප්‍රියන්ත, සරත්ට පෙර ක්‍රීඩාපිටියට පැමිණි අතර සරත්ට පසුව ක්‍රීඩාපිටියෙන් ඉවත්විය. උදය, සරත්ට පසුව ක්‍රීඩාපිටියට පැමිණි අතර, ප්‍රියන්තට පෙර ක්‍රීඩාපිටියෙන් ඉවත්විය. වැඩිම කාලයක් ක්‍රීඩාපිටියේ රැඳී සිටියේ කවුද?

(1) උදය (2) ප්‍රියන්ත (3) සරත්

**22.** තාත්තා අඹවලට සහ අන්නාසිවලට කැමැති නමුත් නාරංවලට අකැමැති ය. අම්මා නාරංවලට සහ අඹවලට කැමැති නමුත් අන්නාසිවලට අකැමැති ය. මම දිවුල්වලට සහ අඹවලට කැමැත්තෙමි. අප තුන්දෙනාම කැමැති පලතුරක් වන්නේ

(1) දිවුල් ය. (2) නාරං ය. (3) අඹ ය.

**23.** මවක් තමා ළඟ තිබූ මුදලෙන් $\frac{1}{2}$ ක් පොත් මිල දී ගැනීමට වියදම් කළේ ය. ඉන්පසු ඉතිරි මුදල සමාන කොටස් දෙකකට බෙදා ඉන් එක් කොටසක් ඇඳුම් මිලදී ගැනීමට වියදම් කළ පසු ඇය ළඟ ඉතිරි වූ මුදල රුපියල් 50 ක් නම් ඇය පොත් මිලදී ගැනීමට වියදම් කළ මුදල කීය ද?

(1) රුපියල් 50 (2) රුපියල් 100 (3) රුපියල් 200

**24.** සමන්ගේ දැන් වයස අවුරුදු 12 කි. ඔහු, ඔහුගේ සහෝදරයා මෙන් හතර ගුණයක් වයස වේ. සමන් ඔහුගේ සහෝදරයා මෙන් දෙගුණයක් වයස් වන්නේ තව අවුරුදු කීයකින් ද?

(1) 6 (2) 10 (3) 24

**25.** 200 යේ බාගයෙන් $\frac{1}{4}$ ට 5 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 25 (2) 30 (3) 35

**26.** 41 සිට 45 තෙක් ගණන සංඛ්‍යා ලියන විට 4 ඉලක්කම ලියැවෙන වාර ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 6

[6 වැනි පිටුව බලන්න

27. රූපවල දැක්වෙන දේවල් හා සම්බන්ධ කාර්ය අනුපිළිවෙළින් අඩංගු පිළිතුර තෝරන්න.




(1) කැපීම ඇඳීම ලිවීම

(2) ලිවීම කැපීම පැළඳීම

(3) කැපීම ලිවීම පැළඳීම

8. රූපයේ දක්වෙන සේ සිලින්ඩරයක හැඩය ඇති ඝන වස්තුවක් සිත් ඉර දිගේ කැපූ විට ලැබෙන මුහුණතේ හැඩය




(1) සෘජුකෝණාස්‍රයකි.

(2) වෘත්තයකි.

(3) ත්‍රිකෝණයකි.

රූපයේ දැක්වෙන ආකාරයේ ඝන වස්තුවක් සිත් ඉර දිගේ කැපූ විට ලැබෙන මුහුණතේ හැඩය කුමක් ද?





(1) (2) (3)


මිනිසුන් දෙදෙනෙක් එකම මොහොතක එකම ස්ථානයකින් එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශාවලට ගමන් ඇරඹා, පළමුවෙන් මීටර 5 බැගින් ගොස් තම දකුණු අත පැත්තට හැරී තවත් මීටර 5 බැගින් ගමන් කළහ. අනතුරුව දෙදෙනාම තම දකුණු අත පැත්තට හැරී තවත් මීටර 5 බැගින් ද ගමන් කළහ. දැන් ඔවුන් දෙදෙනා සිටින්නේ

(1) එකිනෙකාට මීටර 5 ක් දුරිනි.

(2) එකිනෙකාට මීටර 10 ක් දුරිනි.

(3) ආරම්භක ස්ථානයෙහි ය.

A සහ B නම් නගර දෙකක් අතර දුර කිලෝමීටර 10 කි. එක්තරා දිනෙක පෙරවරු 6.00 ට නිමල් A සිට ගමන් අරඹා පැයට කිලෝමීටර 3 බැගින් B දෙසට යයි. සුනිල් එම මොහොතේ ම B සිට ගමන් අරඹා පැයට කිලෝමීටර 2 බැගින් A දෙසට යයි.




නිමල් සහ සුනිල් හමුවන්නේ A සිට කිලෝමීටර


(1) 3 ක් දුරිනි. (2) 5 ක් දුරිනි. (3) 6 ක් දුරිනි.

නිමල් හා සුනිල් හමුවන විට වේලාව කීය ද?

(1) පෙරවරු 7.00 (2) පෙරවරු 8.00 (3) පෙරවරු 9.00

[7 වැනි පිටුව බලන්න

- පහත දැක්වෙන්නේ කුඩා ළමයින්ට බයිසිකල් පැදීම සඳහා ක්‍රීඩා පිට්ටනියක තනා ඇති පාරවල් කිහිපයක් දැක්වෙන සිතියමකි. එහි සෑම කුඩා කොටුවකම පැත්තක දිග සෙන්ටිමීටර 1 ක් වන අතර සෙන්ටිමීටර 1 කින් මීටර 10 ක දුර දැක්වේ.




**33.** ළමයෙක් A ස්ථානයෙන් ආරම්භ කර K, L හා B පසුකොට C තෙක් ගොස් දකුණට හැරී පිළිවෙළි E, F, M හා L පසුකොට D වෙත පැමිණෙයි. ඔහු බයිසිකලය පදින දුර මීටර කීය ද?

(1) 210 (2) 240 (3) 280

**34.** ළමයෙක් I ස්ථානයෙන් පටන්ගෙන K හරහා H තෙක් ගොස් වමට හැරී M හරහා F, E, C, B, J ස D පසුකොට නැවත I වෙත පැමිණෙයි. ඔහු බයිසිකලය පදින දුර මීටර කීය ද?

(1) 210 (2) 240 (3) 280

- පහත දැක්වෙන ඉංග්‍රීසි වචන දෙකෙහි A, D, E, F, H යන ඉංග්‍රීසි අකුරු පහ වෙනුවට 1, 2, 3, 4 යන ඉලක්කම් (අනුපිළිවෙළින් නොවේ.) යොදා, එම ඉලක්කම් ආරෝහණ පටිපාටියෙන් ලියා ඇ

HEAD = 1235

FEED = 1134

**35.** E අකුර වෙනුවට යොදා ඇති ඉලක්කම කුමක් ද?

(1) 1 (2) 3 (3) 5

**36.** D අකුර වෙනුවට යොදා ඇති ඉලක්කම කුමක් ද?

(1) 1 (2) 3 (3) 5

- නිමල් හා කමල් යන දෙදෙනාගේ බරෙහි එකතුව 60 kg ද
කමල් හා අමල් යන දෙදෙනාගේ බරෙහි එකතුව 64 kg ද
නිමල්, කමල් හා අමල් යන තිදෙනාගේ බරෙහි එකතුව 98 kg ද බව දී ඇත්නම්,

**37.** අමල්ගේ බර කොපමණ ද?

(1) 30 kg (2) 34 kg (3) 38 kg

**38.** නිමල් හා අමල් යන දෙදෙනාගේ බරෙහි එකතුව කීය ද?

(1) 68 kg (2) 72 kg (3) 76 kg

[8 වැනි පිටුව බ

- පහත විස්තරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

මගේ නම සජිත් ය. මම පංතිය අවසන් වී ගෙදර එමින් සිටියෙමි. පාර අයිනේ බස් නැවතුමේ පුංචි අම්මා ද බාප්පා ද සිටගෙන සිටියහ. ඒ ඔවුන්ගේ දුව රෝෂිණී පංතිය ඇරී එනතුරු විය යුතු ය. ඔවුහු මා නුදුටුවහ. මොහොතකින් බසයක් බස් නැවතුම්පොළ අසළ නවත්වන ලදී. කාර්යාලවල වැඩ ඇරී එන අයගෙන් බසය පිරී තිබිණ. රෝෂිණී නංගී ඒ බසයෙන් පැමිණියා ය.

**39.** පහත දී ඇති ප්‍රකාශ අතරෙන් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) සජිත් පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු බව කිව හැකි ය.

(2) රෝෂිණී හතරවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක බව කිව හැකි ය.

(3) ඔවුන් දෙදෙනා ඉගෙනුම ලබන ශ්‍රේණි මොනවා දැයි කීමට අපිරු ය.

**40.** පහත දී ඇති ප්‍රකාශ අතරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) සජිත්ගේ පියා රෝෂිණීගේ පියාගේ අයියා විය හැකි ය.

(2) රෝෂිණීගේ මව සජිත්ගේ මවගේ නංගී විය හැකි ය.

(3) රෝෂිණීගේ මව සජිත්ගේ පියාගේ නංගී විය හැකි ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2009

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2009 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 මිනිත්තු 15 යි.**

**විභාග අංකය** : ........................................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **56** ක් ඇත. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ඇත.) **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

**අවසාන ලකුණ**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

[ 2 වැනි පිටුව බලන්න.

1. **පහත දැක්වෙන කොටස කියවන්න.**

වරින්වර හමා ආ සුළඟ නිසා උණ පඳුරු සර සර ගායි. ඉවුර දිගේ දුව ආ සමහර කුඩා සත්තු ජබ්ඃ හඬින් දියට පනිති. ටික වේලාවකට පසු හඳ පායා ආවේ ය. රන්තැටියකින් කිරි ඇදහැලෙන්නා සේ සඳරැස් ගලන්නට විය. ඒ රැසින් නිසල ගඟ දිය ද රන් පැහැ ගත්තේ ය.

සෝමවීර සේනානායක
- ගඟ අද්දර කැලේ -

අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් තෝරා, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඉහත විස්තරයෙන් කියැවෙන්නේ දවසේ කුමන කාලය ද? ........................

(ii) 'සසල' යන්නෙහි **විරුද්ධාර්ථ** පදය කුමක් ද? ........................

(iii) 'තාරපති' යන්නට **සමානාර්ථ** පදය කුමක් ද? ........................

(iv) මෙහි සඳහන් **ප්‍රාණවාචී** බහුවචන නාම පදයක් ලියන්න. ........................

(v) මෙහි ඇතුළත් **උපමාව** ලියන්න. ................................................................

(vi) ඉහත විස්තරය කර ඇත්තේ කෙබඳු **ස්ථානයක** පිට ද? ........................................

2. ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා **හිස්තැන්** පුරවන්න.

(i) ආලෝකය විහිදුවයි : ................................ (පහන, පහණ)

(ii) කුඹුරේදී හෝ හේනේදී හෝ ගොවියා මහන්සිය නිවාගන්නා තැන :

.................................... (පැළ, පැල)

3. (i) පහත සඳහන් වැකිය **ඒක වචනයට** හරවා ලියන්න.

කුරුල්ලෝ හද නිත්දේ පසුවෙති. ................................................................

(ii) පහත සඳහන් වැකිය **බහු වචනයට** හරවා ලියන්න.

තරුව අහසේ බැබළෙයි. ................................................................

4. පහත සඳහන් එක් එක් යෙදුමෙහි **අදහස** ලියන්න.

(i) තැනේ හැටියට ඇඟෙ ගහනවා ................................................................

(ii) ඇහැ ගහගෙන ඉන්නවා ................................................................

5. පහත සඳහන් එක් එක් යෙදුමට **තනි** පද ලියන්න.

(i) රටට ආදරය කරන්නා : ................................

(ii) තමන්ගේ වාසියට පමණක් කටයුතු කරන්නා : ................................

(iii) ගමෙන් මිනිසුන් එගොඩ කරන්නා : ................................

[ 3 වැනි පිටුව බලන්න.

6. සුදුසු විරාම **ලකුණු** යොදන්න.

(i) අපොයි මුදලාලි අහුවුණා ද

(ii) යාළුවේ කරහවෙන්නට එපා

7. වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

ඇළ / ආදියට / කසල / ගංගා / අපවිත්‍ර / දැමීමෙන් / දොළ / වේ / ජලසම්පත

..........................................................................................................................................

..........................................................................................................................................

8. පහත එක් එක් යෙදුමේ **අදහස** ලියන්න.

(i) කළවා මාරපත් ගියා වගේ.

..........................................................................................................................................

(ii) බල්ලා පිදුරු කන්නෙත් නැහැ, කන ගොනාට දෙන්නෙත් නැහැ.

..........................................................................................................................................

9. එක් එක් සිංහල වචනය සඳහා ගැළපෙන ඉංග්‍රීසි වචන **(ඉංග්‍රීසි අකුරෙන්)** ලියන්න.

(i) උදේ ..................... (ii) සවස ..................... (iii) රාත්‍රිය .....................

10. අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) Be careful. : ..........................................................................

(ii) What is this? : ..........................................................................

(iii) I am drinking water. : ..........................................................................

1. පහත දැක්වෙන එක් එක් දෙමළ වැකියේ අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) ඉදු එනදු කදිරෛ : ..........................................................................

(ii) පාල් වෙල්ලෛ නිරම් : ..........................................................................

2. පහත දැක්වෙන මල් වර්ග අතරින් සවස පිපෙන මල් වර්ගය වන්නේ,

(1) වකුසුද්ද ය. (2) කුමුදු ය. (3) ජේපාලිකා ය. (4) හෙන්දිරික්කා ය.

. රාත්‍රී කාලයේ දී සැරිසරන පක්ෂියකු **නොවන්නේ**

(1) බස්සා ය. (2) උලමා ය. (3) කෑදැත්තා ය. (4) බකමූණා ය.

[ 4 වැනි පිටුව බලන්න.

14. පලතුරු වගාවට බෙහෙවින් හානි කරන සතකු වන්නේ
(1) කැරපොත්තා ය. (2) පිටි මකුණා ය. (3) දළඹුවා ය. (4) මකුළුවා ය.

15. ඈතින් ඇති ගොදුරු දැක අල්ලා ගැනීමට වඩාත් ම හැකියාව ඇති කුරුල්ලකු වන්නේ
(1) කොකා ය. (2) උකුස්සා ය. (3) රාජාලියා ය. (4) වැහි ලිහිණියා ය.

16. බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම යොදා ගැනීමේ ඇති වාසියක් **නොවන්නේ**,
(1) පහසුවෙන් සාත්තු සප්පායම් කළ හැකි වීමයි.
(2) අව්වැසි ආදියෙන් ආරක්ෂා කරගත හැකි වීමයි.
(3) අවශ්‍ය විට එහා මෙහා කළ හැකි වීමයි.
(4) ඉඩකඩ ඇති තැන්වල පමණක් වගා කළ හැකි වීමයි.

17. ගෙවත්තේ බෝග වගාවට හානි කරනු ලබන කෘමීන්ගේ පැමිණීම වළක්වාලීමට වගා කරන ශාකයක් වන්නේ
(1) මදුරුතලා ය. (2) ගඳපාන ය. (3) පැහිරි ය. (4) දහස්පෙතියා ය.

18. **ශරීර වර්ධනය** සඳහා වැඩි බලපෑමක් ඇති කරනු ලබන ආහාර යුගලයක් වන්නේ
(1) එළකිරි සහ දෙඩම් යුෂ ය. (2) බිත්තර සහ කුරක්කන් රොටි ය.
(3) මුංඇට සහ සෝයා බෝංචි ය. (4) සෝයා බෝංචි සහ නිවිති ය.

19. කැඳ සෑදීම සඳහා ගන්නා කොළ වර්ගයක් **නොවන්නේ**
(1) ගොටු කොළ ය. (2) යකිනාරං කොළ ය.
(3) කෝප්ප කොළ ය. (4) එළබටු කොළ ය.

20. ප්ලාස්ටික් කෝප්පයක අසුරන ලද යෝගට් කෑමට ප්‍රථම විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ
(1) අසුරන ලද දිනය ගැනයි. (2) කල් ඉකුත්වන දිනය ගැනයි.
(3) අඩංගු දේ ගැනයි. (4) ප්‍රමිති ලාංඡනය ගැනයි.

21. බත් පිසීම සඳහා සහල් ගැරීමට වඩාත් ම උචිත භාජනය වන්නේ
(1) මැටිකෝප්පයයි. (2) වළඳයි. (3) නැඹිලියයි. (4) කොරහයි.

22. මෙම සංකේතයෙන් ප්‍රකාශවන්නේ



(1) ගැබිනි මව්වරුන් සඳහා බව
(2) ආබාධිත අය සඳහා බව
(3) වයස්ගත වූවන් සඳහා බව
(4) ළමයින් සඳහා බව

23. රාජ්‍ය ආයතනවලින් සැපයෙන සේවා හා සම්බන්ධ තොරතුරු දැනගැනීම සඳහා ඇමතිය යුතු දුරකථන අංකය
(1) 118 වේ. (2) 119 වේ. (3) 1231 වේ. (4) 1919 වේ.

24. ලියාපදිංචි තැපැලෙන් මෙරට තුළ ලිපියක් යැවීම සඳහා කොපමණ වටිනාකමින් යුත් මුද්දර අවම වශයෙන් අවශ්‍ය වේ ද?
(1) රු. 20.00 (2) රු. 25.00 (3) රු. 30.00 (4) රු. 35.00

25. කුඹුරේ ලියැද්දකින් තවත් ලියැද්දකට වතුර බැසයාමට නියරේ කපා ඇති මාර්ගය වන්නේ
(1) සොරොව්ව ය. (2) බිසෝකොටුව ය. (3) ඇළ ය. (4) වක්කඩ ය.

[ 5 වැනි පිටුව බලන්න.

ලංකාවේ උස් බිම් හා පහත් බිම් දැක්වෙන සිතියමක **උස් බිම්** වර්ණ කර තිබෙන්නේ
(1) නිල් පාටිනි. (2) දුඹුරු පාටිනි. (3) රතු පාටිනි. (4) කොළ පාටිනි.

ලංකාවේ ප්‍රධාන ගංගා දෙකක් එකම පළාතකින් මුහුදට ගලා බසී. ඒ ගංගා දෙක නම්
(1) මහවැලි සහ වලවේ වේ.
(2) වලවේ සහ කැලණි වේ.
(3) කැලණි සහ කළු වේ.
(4) ගිං සහ කළු වේ.

ලංකා රාජ්‍ය ලාංඡනයේ **සදාකාලික පැවැත්ම** නිරූපණය වන්නේ
(1) ධර්මචක්‍රය මගිනි.
(2) පුන්කලස මගිනි.
(3) පලාපෙති මගිනි.
(4) ඉර සහ හඳ මගිනි.

ලංකාවේ පළමුවෙන් ම ඉදි වූ වැව වන්නේ
(1) තිසා වැව ය.
(2) ගිරිතලේ වැව ය.
(3) බසවක්කුලම ය.
(4) වව්නිකුලම ය.

ශ්‍රී ලංකාවට උදාර සේවයක් සිදු කළ, මෙම රූපයේ දැක්වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා කවුද?



(1) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා
(2) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
(3) ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා
(4) ආචාර්ය ටී. බී. ජයා මහතා

අකුණුසර වැදීමට වඩාත් ම ඉඩ ඇත්තේ
(1) වාහනයක ගමන් කරන විට ය.
(2) එළිමහන් පිට්ටනියක රැඳී සිටින විට ය.
(3) ලැලි ඇතිරූ බිමක සිටගෙන සිටින විට ය.
(4) තාර පාරක ගමන් කරන විට ය.

බල්ලකු සපා කෑ අවස්ථාවක දී ප්‍රථමයෙන් ම කළ යුතු වන්නේ
(1) සපා කෑ ස්ථානය රෙදි පටියකින් ගැටගැසීම ය.
(2) සපා කෑ ස්ථානය සබන් ගා පිරිසිදු ජලයෙන් සේදීම ය.
(3) සපා කෑ ස්ථානය මත බෙහෙත් ගැල්වීම ය.
(4) රෝගියා වෛද්‍යවරයකු වෙත ගෙන යාම ය.

සූර්ය නමස්කාර අභ්‍යාසයේ හතරවන අවස්ථාව දැක්වෙන රූපය කුමක් ද?



(1)


(2)


(3)


(4)

මෙම රූපයේ දැක්වෙන පරිදි ගෙම්බුලේ කොටු ඇඳ කරනු ලබන ක්‍රීඩාව වන්නේ



(1) එක්ගුඩු ය. (2) බට්ටා පැනීම ය.
(3) ලුණු පැනීම ය. (4) ගුඩු පැනීම ය.

[ 6 වැනි පිටුව බලන්න.

**35.** බටනලාවක සිදුරු නිවැරදි ව දැක්වෙන රූපය කුමක් ද?


(1)


(2)


(3)


(4)

**36.** ඇවිලෙමින් පවතින ගිනි අඟුරු සහිත ගින්නකට වියළි ලුණු කැට ස්වල්පයක් දැමූ විට සිදුවන්නේ

(1) ලුණු කැට දියවීමයි.
(2) ලුණු කැට ශබ්ද නගා පිපිරී යාමයි.
(3) ලුණු කැට ඇවිලී යාමයි.
(4) ගිනි දැල් නිවී යාමයි.

**37.** ලුණු කුඩු ඉක්මනින් දිය වන්නේ

(1) උණු ජලයේ ය.
(2) ඇල් ජලයේ ය.
(3) ශීත කළ ජලයේ ය.
(4) උණුකර නිවාගත් ජලයේ ය.


**38.** කාන්දම් කැබැල්ලකට ඇදී එන ද්‍රව්‍ය යුගලයක් වන්නේ

(1) පිත්තල සහ යකඩ ය.
(2) ඇලුමිනියම් සහ පිත්තල ය.
(3) යකඩ සහ වානේ ය.
(4) යකඩ සහ ඇලුමිනියම් ය.


**39.** පිත්තල මේස හැන්දකට ජලය ස්වල්පයක් දමා ඉටිපන්දම් දැල්ලකට ඇල්ලීමෙන්

(1) ජලයේ වර්ණය වෙනස් වේ.
(2) ජලය වාෂ්ප වේ.
(3) ජලයේ ස්වරූපය වෙනස් නොවේ.
(4) ජලය සහිත හැන්ද රත් නොවේ.


**40.** වියළි කෝෂ (C) දෙකක්, බල්බයක් (B) සහ ස්විචයක් (S) වයර් කැබලි මගින් පහත සඳහන් ආකාරවලට සම්බන්ධ කර ඇත. ස්විචය දැමූ විට බල්බය දැල්වෙන්නේ කුමන රූපයේ ද?




(1)



(2)



(3)



(4)

**41.** ශ්‍රී ලංකාවේ පළාත් **දෙකක** නම් ලියන්න.


(i) .............................................................. (ii) ..............................................................

**42.** පෙන්වා ඇති ඉලක්කම් කාඩ්පත් හතරම යොදා සෑදිය හැකි විශාල සංඛ්‍යාව කුමක් ද?

| | |
|---|---|
| 6 | 0 |
| 5 | 9 |

..................

**43.**




විස්කෝතු පැකැට්ටුවක් රූපයේ පෙන්වා ඇත.

එහි (i) දාර ගණන කීය ද? ..................


(ii) සමචතුරස්‍ර මුහුණත් ගණන කීය ද? ..................

[ 7 වැනි පිටුව බලන්න.

44. 9540 ට 805 ක් එකතු කරන්න. එකතුව කීය ද? ....................

45. 6045 න් 350 ක් අඩු කරන්න. වෙනස කීය ද? ....................


46. ප්‍රාථමික පාසලකට සිසුන් පැමිණෙන වාහන පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ දැක් වේ.




(i) වෑන්වලින් සහ ත්‍රිරෝද රථවලින් පැමිණෙන සිසුන් අතර වෙනස කීය ද? ....................


(ii) වෙනත් ආකාරවලින් පැමිණෙන සිසුන් මුළු සංඛ්‍යාව 55 ක් බව සොයාගන්නා ලදී. එම සංඛ්‍යාව ප්‍රස්තාරයේ අදාළ තීරුවේ ලකුණු කර, තීරුව අඳුරු කරන්න.


47. A සහ B භාජනවල ඇති ජල පරිමා අතර වෙනස මිලිලීටර කීය ද?




.................... ml

48. පෙන්වා ඇති රූපයේ පරිමිතිය කොපමණ ද? ....................



49. පෙන්වා ඇති කොටු රූපය සමාන කොටස්වලට බෙදා ඇත. එහි මුළු වර්ගඵලයෙන් 0.3 ක කොටසක් අඳුරු කරන්න.


50. රුපියල් 47.00 ක අභ්‍යාස පොතක් සහ රුපියල් 12.50 ක පෑනක් මිලට ගැනීමට මා ළඟ තිබෙන්නේ රුපියල් 50.00 කි. තව කොපමණ මුදලක් අවශ්‍යවේ ද? ....................

51. අඹගෙඩි 420 ක් පෙට්ටි හතරක සමානව අසුරන ලදී. එක් පෙට්ටියක අසුරන ලද අඹගෙඩි ගණන කීය ද? ....................

52. බෝතලයක අඩංගු ජල පරිමාව 750 ml වේ. එවැනි බෝතල් 9 ක අඩංගු ජල පරිමාව කොපමණ ද? ....................

[ 8 වැනි පිටුව බලන්න.

53. ඔරලෝසු මුහුණත දෙස බලන්න. එහි පැය කටුව හා මිනිත්තු කටුව අතර කෝණය මීට පසුව සෘජුකෝණයක් වන්නේ තව මිනිත්තු කීයකට පසුව ද?





..........................

54. නාට්‍යයක් සඳහා ටිකට්පත් විකිණීමෙන් ලහිරු එකතු කළ මුදල රුපියල් 1525 කි. නිෂාර් එකතු කළ මුදල ලහිරුට වඩා රුපියල් 175 කින් වැඩි ය. කමලා එකතු කළ මුදල ලහිරුට වඩා රුපියල් 175 කින් අඩු ය. තිදෙනා ම එකතු කළ මුළු මුදල කීය ද?

..........................

55. ළමයකු පාසල් පිට්ටනියේ A නම් ලක්ෂ්‍යයකින් පටන් ගෙන 10 m දුරක් නැගෙනහිරට ද එතැන් සිට 20 m දුරක් දකුණට ද එතැන් සිට 30 m දුරක් බස්නාහිරට ද ගමන් කර B නම් ලක්ෂ්‍යය වෙත පැමිණේ. B ලක්ෂ්‍යය සහ ළමයාගේ ගමන් මඟ සපයා ඇති කොටු රූපයේ ලකුණු කරන්න. රූපයේ කුඩා කොටුවක මිනුම් පැත්තක් 10 m දුරක් නිරූපණය කරන බව සලකන්න.




56. පහත දැක්වෙන රූප රාමු ඇසුරු කරගෙන, ඉදිරියේ දී සිදුවිය හැකියැයි ඔබ සිතන දේ නිර්මාණාත්මකව ලියන්න. ඔබගේ අදහස් වාක්‍ය **හයකට** සීමාකරන්න. එක් එක් වාක්‍යයේ අඩු වශයෙන් වචන **පහක්වත්** ඇතුළත් විය යුතු ය. එම වාක්‍යවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.



(i) ..........................................................................................

..........................................................................................

(ii) ..........................................................................................

..........................................................................................

(iii) ..........................................................................................

..........................................................................................

(iv) ..........................................................................................

..........................................................................................

(v) ..........................................................................................

..........................................................................................

(vi) ..........................................................................................

..........................................................................................

* * *